කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

2026 නොවැම්බර් මස 01 දින සඳහා කාලගුණ අනාවැකිය
2026 නොවැම්බර් මස 01 දින උදෑසන 05.30 ට නිකුත්කරන ලදි.

බස්නාහිර, සබරගමුව, මධ්‍යම, ඌව සහ දකුණු පළාත්වල සහ අම්පාර සහ මඩකළපුව දිස්ත්‍රික්කවල පස්වරු 1.00 න් පසුව තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. ඇතැම් ස්ථාන වලට **මි.මී. 50** ට වැඩි තරමක තද වැසි ඇති විය හැක.

දිවයිනේ සෙසු ප්‍රදේශවල ප්‍රධාන වශයෙන් වැසි රහිත කාලගුණ තත්ත්වයක් අපේක්ෂා කෙරේ.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

බස්නාහිර, සබරගමුව, මධ්‍යම සහ ඌව පළාත්වලත් කුරුණෑගල සහ අනුරාධපුර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවල අළුයම් කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් පැවතිය හැක.

WEATHER FORECAST FOR 01 NOVEMBER 2026
Issued at 05.30 a.m. on 01 November 2026.

Showers or thundershowers will occur at a several places in Western, Sabaragamuwa, Central, Uva and Southern provinces and in Ampara and Batticaloa districts after 1.00 p.m. Fairly **heavy falls above 50 mm** are likely at some places in these areas.

Mainly fair weather conditions are expected in other areas of the Island.

The general public is kindly requested to take adequate precautions to minimize damage caused by temporary localized strong winds and lightning during thundershowers.

Misty conditions can be expected at some places in Western, Sabaragamuwa, Central and Uva provinces and in Kurunegala and Anuradhapura districts during the early hours of the morning.

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
GENERAL WEATHER FORECAST FOR SRI LANKA
ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
2026 නොවැම්බර් මස 01 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

ගිනිකොණදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති පීඩන අවපාතය 2026 ඔක්තෝබර් මස 31 වන දින රාත්‍රී 11.30 වන විට එම මුහුදු ප්‍රදේශයේම උතුරු අක්ෂාංශ 10.9° සහ නැගෙනහිර දේශාංශ 87.5° ආසන්නයේ කේන්ද්‍රගතව පැවතුණි. මෙම පද්ධතිය බටහිර-වයඹ දෙසට ගමන් කරමින්, නොවැම්බර් මස 01 වන දින පෙරවරු 11.30 පමණ වන විට නිරිතදිග සහ ඊට යාබද ගිනිකොණදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වීමට ඉතා ඉහළ සම්භාවිතාවක් පවතී. තවදුරටත් බටහිර-වයඹ දෙසට ගමන් කරමින්, එදින රාත්‍රී 11.30 පමණ වන විට නිරිතදිග සහ ඊට යාබද බටහිර-මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව සුළි කුණාටුවක් දක්වා වර්ධනය වීමට ද, නොවැම්බර් මස 02 වන දින වන විට බටහිර-මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව ප්‍රබල සුළි කුණාටුවක් දක්වා තවදුරටත් තීව්‍ර වීමට ද ඉතා ඉහළ සම්භාවිතාවක් පවතී.

උතුරු අක්ෂාංශ 10 ත් 15 ත් සහ නැගෙනහිර දේශාංශ 80 ත් 90 ත් අතර මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැයට කිලෝමීටර (70-80) දක්වා ඉහළ යා හැකි අතර, ගිගුරුම් සහිත තද වැසි ඇති විය හැක. එමෙන්ම මෙම මුහුදු ප්‍රදේශ ඉතා රළු විය හැක.එමනිසා එම මුහුදු ප්‍රදේශවල නැවත දැනුම් දෙන තුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වළකින ලෙසත් එම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතු වල යෙදෙන ප්‍රජාවන් ආරක්ෂිත ප්‍රදේශ කරා යාත්‍රා කරන ලෙසත් උපදෙස් දෙනු ලැබේ.
මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ධීවර සහ නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

වැසි තත්ත්වය:

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

සුළඟ:

කන්කසන්තුරය සිට මඩකලපුව හරහා පොතුවිල් දක්වා මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දෙසින් හමන අතර දිවයින වටා අනෙකුත් මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව හමා එයි. සුළඟේ වේගය **පැ.කි.මී. (25-35)** පමණ වේ.

මුහුදේ ස්වභාවය:

දිවයින වටා වන මුහුදු ප්‍රදේශ මදවශයෙන් රළු අවස්ථාවේ පවතී.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං (පැ.කි.මී. 60-70) ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS

Issued at 05.30 a.m. on 01 November 2026.

The depression over the Southeast Bay of Bengal was centred over the same region near latitude 10.9°N and longitude 87.5°E at 11.30 p.m. on 31 October 2026. The system is very likely to move west-northwestwards and intensify into a deep depression over the Southwest Bay of Bengal and adjoining Southeast Bay of Bengal around 11.30 a.m. on 01 November 2026. Continuing to move west-northwestwards, it is very likely to intensify further into a cyclonic storm over the Southwest Bay of Bengal and adjoining Westcentral Bay of Bengal around 11.30 p.m. on the same day. It is also very likely to intensify further into a severe cyclonic storm over the Westcentral Bay of Bengal by 02 November 2026.

Wind speeds in the sea areas between 10°N and 15°N latitudes and 80°E and 90°E longitudes may occasionally increase up to (70–80) kmph. Heavy showers or thundershowers are likely, and these sea areas may be very rough. Therefore, Naval and fishing communities are warned not to venture to the above mentioned sea areas until further notice. Naval and fishing communities operating in those sea areas are advised to move away from the affected sea areas.

The naval and fishing communities, are requested to be attentive to the future forecasts and bulletins issued by the Department of Meteorology in this regard.

Condition of Rain:

Showers or thundershowers will occur at several places in the sea areas around the island.

Winds:

Winds will be North-easterly in the sea areas extending from Kankasanthurai to Pottuvil via Batticaloa. Winds will be South-westerly or variable in the other sea areas around the island. Wind speed will be **(25-35) kmph.**

State of Sea:

The sea areas around the island will be moderate.

Temporarily strong gusty winds (60-70 kmph) and very rough seas can be expected during thundershowers.

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි